# පාරිසරික සුරක්ෂිතතාවය ඇතිවන අයුරින් නගර නිර්මාණය කරන්නේ කෙසේද?

පරිසරය යන්නෙහි සරල අරුත නම් අප අවට ඇති වටපිටාවයි. නැතහොත් මිනිසා ඇතුළු සෙසු ජීවීන්ගේ පැවැත්මට බලපාන්නා වූ ජීවී හා අජීවී වටපිටාව පරිසරය ලෙස හැඳින්විය හැකිය. මේ අනුව පරිසරයේ අංග ලෙස ගංගා ඇළ - දොළ, සාගර, ගස් වැල් හා වායු ගෝලය ආදිය ගැනෙන අතර, පරිසරයට අයත් වන මෙම අංගයන්ගේ මනා පැවැත්ම මිහිතලයේ වෙසෙන මිනිසා ඇතුළු සියලු සත්ත්වයන්ගේ පැවැත්ම සඳහා වැදගත් වේ. පරිසරය දූෂණය යනු පරිසර පද්ධතියේ සමතුලිතතාවය බිඳ දැමීමයි. පරිසරයේ සමතුලිතතාවය බිඳ වැටීමට ප්‍රධාන වශයෙන්ම බලපානු ලබන්නේ, ස්වභාවික කරුණු හා මිනිසා විසින් පෘතුවිය මතුපිට සිදු කරනු ලබන විවිධ මානව ක්‍රියාකාරකම්ය. මේ අනුව, කිනම් ආකාරයකට හෝ අප අවට පරිසරයේ සමතුලිතතාවය බිඳ වැටීම පෘතුවියේ වාසය කරන මිනිසා ඇතුළු සියලුම සත්වයින්ට බලපානු ලබයි. එනම්, පෘතුවිය මත මානව හා සත්ත්ව ජීවිත රඳා පවතින්නේ පාරිසරික සුරක්ෂිතතාවය පවත්නා තාක් කල් පමණි.

මානව සංහතියේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය අංගයක් ලෙස ගැනෙන අප අවට පරිසරයේ සමතුලිතතාවය බිඳ දැමීමට අද ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ පෘතුවිය මතුපිට සිදු කරනු ලබන මානව ක්‍රියාකාරකම් ලෙස හඳුනාගෙන ඇති අතර, මෙම ස්වභාවික පරිසරය විනාශ වීමෙන් පැන නැගෙන අයහපත් පාරිසරික ගැටළුවලින් සෘජුවම පීඩා විඳින්නේ ද මිනිසාය. ලෝක ජනගහනය ක්‍රමයෙන් වැඩිවත් ම ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ගනු ලැබූ ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් ලෙසට පරිසරයේ සමතුලිතතාවය බිඳ වැටීමට පටන් ගැනීන" ලෝකයේ භූ විෂමතා ලක්ෂණ හා දේශගුණික

රටාවට අනුව, අසීමිත ජනගහනයකට වාසය කළ හැක්කේ සීමිත බිම් ප්‍රමාණයක වූ බැවින්, ඉක්මනින් හා පහසුවෙන් වැඩි දියුණු කර ගත හැකි වූ ප්‍රදේශ නගර බවට පත් විය. මේ ආකාරයට වැඩි පහසුකම් ඇති ප්‍රදේශ කරා ජනයා සංක්‍රමණය වීම හා ගොඩනැගිලි, මහා මාර්ග ඉදිකිරීම ආදිය බහුල වීමෙන් නගර බිහි වූ අතර, අධික ජනගහනයෙන් යුත් නගර බිහි වීමත් සමගම ඒ තුළින් පැන නැගුණ සංකීර්ණ ගැටළු රැසකට ද ජනතාවට මුහුණ පෑමට සිදු විය.

නගරයක් යනු නිවාස, වෙළඳාම, නිෂ්පාදන, විනෝදාංශ, සංස්කෘතිමය අංග, ගමනාගමනය, රැකියා උත්පාදන අංශයන් වැනි එකිනෙක හා බැඳී පවතින ක්‍රියාදාමයන් රැසක් ඒකරාශී වූ භූමි ප්‍රදේශයක් ලෙස හඳුන්වා දිය හැකි අතර නගර වලට මිනිස් ශිෂ්ටාචාරයේ තරමටම පැරණි ඉතිහාසයක් ද ඇත. එදා මෙන් නොව අද ලෝකයේ නාගරික ප්‍රදේශ බහුලව දක්නට ලැබෙන අතර දිනෙන් දින නාගරික ප්‍රදේශ බිහි වීමේ ශීඝ්‍රතාවය නිසා එය අද සමාජ ගැටළුවක් බවට පත් වී තිබේ. ශීඝ්‍ර නාගරීකරණය ශ්‍රී ලංකාවට පමණක් නොව අද ලෝකයේ සෑම රටකටම පොදු වූ ප්‍රශ්නයක් බවට පත් වී තිබේ.

1920 ගණන් වලදී ලෝක ජනගහනයෙන් 19% ක් පමණ වූ පිරිසක් සුළු නගර හා මහ නගරවල ජීවත් වූ අතර අද එය 30%ක් දක්වා ඉහළ ගොස් ඇත. ලෝක නිවාස සමීක්ෂණය නම් වූ එක්සත් ජාතීන්ගේ සංවිධානය නිකුත් කළ අධ්‍යයන වාර්තාවට අනුව, මී ලඟ දශකය ඇතුලතදී ලෝක ජනගහනයෙන් 51%ක් ජීවත් වනුයේ නාගරික ප්‍රදේශයන්හිය. මේ අනුව අද වන විට ලෝක ජනගහනයෙන් හරි අඩක්ම නාගරික ප්‍රදේශවල ජීවත් වේ. ලෝක ජනගහනයෙන් වැඩි කොටසක් අද ජීවත් වනුයේ පාරිසරික සම්පත් හා ජන සංඛ්‍යා අතර සමතුලිතතාවය පිරිහී යමින්

පවතින ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවලය. වසර 2005 දී අප වෙසෙන පාර්ථිව නැමති ග්‍රහ ලෝකයේ ජනගහනයෙන් 2/3 ක් පමණ වාසය කරනු ඇත්තේ, ප්‍රධාන නගරවල බවට මත පල වී ඇති අතර, රට සමානුපාතිකව අනාගතයේදී නව මාදිලියේ නාගරික හා පාරිසරික ප්‍රශ්න රැසක් ද පැන නගිනු ඇත. වසර 2015 දී මිලියන 08කට වැඩි ජනගහනයකින් සමන්විතව බිහි වන මහා නගර 30න් නගර 22ක්ම අයත් වනුයේ ආසියාවේ වීම නිසා මෙම ප්‍රශ්නයේ බැරෑරුම්කම තවත් තිව්‍ර වනු ඇත. මේ නිසා නගර නිර්මාණය කිරීමේදී අද පාරිසරික සුරක්ෂිතතාවය කෙරෙහි වෙන කවරදාකටත් වඩා සැළකිලිමත් වීමට සිදු වී ඇත. මේ අනුව නගර නිර්මාණය කිරීමේදී අවට පරිසරයේ පවත්නා ගංගා, ඇල දොළ, මහපොළව, වායු ගෝලය, ගස් කොලන් හා වන සත්තු පමණක් නොව සංස්කෘතික පරිසරයද ආරක්ෂා කර ගනිමින් භූමියේ උපරිම උපයෝගිතාවය රැකෙන සේ නගර නිර්මාණය කළ යුතු වේ.

පරිසර සුරක්ෂිතතාවය ඇති වන අයුරින් නව නගර නිර්මාණය කිරීමේදී අපේ මුතුන් මිත්තන්ගේ ඉපැරණි නගර නිර්මාණ ශිල්පීය දක්ෂතාවයන් සිහිපත් කරමින් හා ආදර්ශයට ගනිමින් අප රටේ පරිසරය අලංකාර කිරීම සහ ශාරීරික හා මානුෂික සුවය පිණිස නගර තුළ සිත් ඇද ගන්නා සුළු තුරු ලතා සිටුවීම කළ යුතු වේ. සිසිලසක් ලබා දෙනවා පමණක් නොව රථ වාහනවලින් ඇති කරන ශබ්දය උරා ගැනීමක් හා පාලනයක් සිදු කරනවා මෙන්ම එම ගස්වල පත්‍රවලින් අවට පරිසරයේ ඇති දූවිලි උරා ගැනීමක් ද සිදු කරනු ලබයි. තවද පරිසරයේ කාබන්ඩයොක්සයිඩ් වායුව ශාක පත්‍ර මගින් උරාගෙන සත්ත්ව සංහතියේ ජීවනාලිය බදු ඔක්සිජන් වායුව මිහිතලයට මුදා හැරීමේ අසිරිමත් කාර්යයද සිදු කරනු ලබයි. එමෙන්ම ගස්වැල් මගින් මනුෂ්‍යයාට අවශ්‍ය ආහාර ලබා දෙන අතර ම අතිකුත් සිව්පාවුන් හා පක්ෂීන්ට අවශ්‍ය වාසස්ථාන සපයන අතර උස් බිම්වල පාංශු ඛාදනය වලකාලනු ලබයි. තවද නගර නිර්මාණය කිරීමේදී නාගරික ජන ජීවිතය දියුණු හා සුවදායි එකක් වන පරිදි හා සැම විටම අවට පරිසරය ආරක්ෂා වන පරිදි කටයුතු කළ යුතු වේ. විශේෂයෙන් ම නව නගර නිර්මාණය කිරීමේදී පරිසරය වැඩි දියුණු කරනු ලබන අතර ම ජනතාවගේ පහසුව සඳහා මහාමාර්ග, ජල සැපයුම් සනීපාරක්ෂාවන්, කැළි කසළ කළමනාකරණය විධිමත් කළ යුතු අතරම, බස් නැවතුම් පොළවල්, පදික වේදිකා, බැංකු, ආරෝග්‍ය ශාලා, පාසැල් තැපැල් කාර්යාල, වෙළඳ පොළවල් හා විවිධ සේවා ස්ථාන පිහිටුවීම හා වැඩි දියුණු කිරීම අත්‍යාවශ්‍ය වේ.

දියුණු වෙමින් පවතින රටවල් අතරට ගැනෙන ශ්‍රී ලංකාවද ශීඝ්‍ර නාගරිකරණය නම් වූ මෙම සංකීර්ණාත්මක ගැටළුවට අද සාජුවම මුහුණ පා සිටී. ආර්ථිකමය හේතු, අධ්‍යාපන, සෞඛ්‍ය හා රැකී රක්ෂා යන සාධක හේතු කොටගෙන දිනෙන් දින ග්‍රාමීය ප්‍රදේශවලින් අප රටේ නාගරික ප්‍රදේශවලට සංක්‍රමණය වන පිරිස ඉහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරනු ලබයි. මේ තුළින් විවිධ පාරිසරික ගැටළුවල පමණක් නොව ආර්ථික, සමාජයීය ප්‍රශ්න රැසක් ද අප රට තුළ පැන නැගී ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ම නගරය වන කොළඹ නගරයේ පැන නැගී ඇති විවිධ සංකීර්ණ පාරිසරික හා නාගරික ප්‍රශ්න රැසකටම මුල් වී ඇත්තේ නාගරික ජනගහනයේ ශීඝ්‍ර වර්ධනයයි. නාගරික ප්‍රදේශවල රැකී රක්ෂා කිහිපයක් අතුරින් වැඩිම අදායමක් ලබා ගැනීමට හැකි වන ආකාරයේ රැකියාවක් තෝරා ගැනීමේ අවස්ථාව තිබීම නිසා ග්‍රාමීය ප්‍රදේශවලින් නගරවලට සංක්‍රමණය වන පිරිස වැඩි වී ඇත. දැනට කොළඹ නගරයේ පමණක් පැල්පත් 15000 ක් දක්නට

ඇත. මේ අනුව රටේ ප්‍රධාන නගරයේ ජීවත් වන මුළු ජනගහනයෙන් 57%ක් පමණ සමන්විත වී ඇත්තේ මුඩුක්කු හා පැල්පත් වාසීන්ගෙනි. නාගරික ප්‍රදේශවල ඉඩම් හිඟය හා ඉඩම්වල මිල ඉහළ නැගීම නිසා අඩු ආදායම් ලබන ජන කොටස් වලට නිවාස ඉදිකර ගැනීම සඳහා ඉඩම් මිළදී ගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස නාගරික ප්‍රදේශවල නිවාස ඉදි කර ගැනීම සඳහා ඉඩම් සොයන අඩු ආදායම් ලබන පුද්ගලයින් බොහෝ විට රජයට හා පළාත් පාලන ආයතන වලට අයත් නාගරික ඉඩම්වල හා ජලය ගලා බසිනා ඇළ මාර්ග දෙපස ඇති රක්ෂිත ප්‍රදේශවල බලහත්කාරයෙන් පදිංචි වීම පුරුද්දක් කරගෙන ඇත. මේ අතර තවත් පුද්ගලයන් නාගරික ප්‍රදේශවල පිහිටි රජය සතු වගුරු බිම් සහිත පහත් බිම් අවිධිමත් ලෙස පුරවා නිවාස ඉදිකිරීමට පෙළඹී සිටී. මෙහි ප්‍රතිඵලයක් ලෙස සැළසුම් නොකරන ලද එමෙන්ම විධිමත් ලෙස සංවර්ධනය නොකරන ලද වගුරු සහිත පහත් බිම් ඇල මාර්ග දෙපස ඇති ඉවුරු වල අනවසර නිවාස ඉදි කිරීම නිසා සුළු වර්ෂාවකින් පවා ඇති වන ජල ගැලීම් හා ගං වතුර තත්ත්වයන් නිසා විවිධ සමාජ ආර්ථික හා පාරිසරික ගැටළු උද්ගත වී ඇත. තවද, ඇල මාර්ගවලට කුණු කසල හා ජලය බැස යාමට බාධා කරන ද්‍රව්‍ය එක්රැස් කිරීම නිසා ඇල මාර්ග පිටාර ගැලීමෙන් වාර්ෂිකව දේපල හා ජීවිත හානි සිදු වේ. එබැවින් නව නගර නිර්මාණය කිරීමේදී නගර වල වාසය කළ හැකි නිශ්චිත ජනගහනය පිළිබඳව සැළකිලිමත් විය යුතු අතර එකී ජන සංඛ්‍යාව ඉක්මවා යන පරිදි බාහිර ප්‍රදේශවලින් සිදු වන අනවශ්‍යය ජන සංක්‍රමණයන් හා අනවසර ඉදිකිරීම් නතර කිරීමට ක්‍රමෝපායන් හා නීති රීති සම්පාදනය කිරීම අවශ්‍යයෙන්ම කළ යුතුව ඇත.

නව නගර පිහිටුවීමේදී එහි නාගරික ප්‍රදේශය තුළ පවත්නා තෙත් බිම් සම්බන්ධව ද සැලකිලිමත් විය යුතුය. මක් නිසාද යත් නාගරික ප්‍රදේශවල පිහිටි තෙත් බිම් වලින්, වනාන්තර වලින් මෙන්ම මානව ප්‍රජාවට විශාල සේවයක් සිදු වන බැවිනි. තෙත් බිම් අපතේ හැරීමක් නොවන අතර ඒවා පරිසර පද්ධතියේ පැවැත්මටත්, පොළවේ තෙතමනය රැක ගැනීමටත්, ගං වතුරින් ඇති වන ආපදා අවස්ථාවලදී අධික වර්ෂා ජලය රඳා පවතින ප්‍රදේශයක් වශයෙන් ක්‍රියා කර ගං වතුරින් සිදු වන හානි අඩු කර ගැනීමටත් නගර අලංකාර කරන පක්ෂීන්, සතුන් හා මත්‍යසයින් ආදී විවිධ ජීවීන්ට වාසස්ථානයක් වන්නේත් එමෙන්ම ස්වභාවික සෞන්දර්යය ආරක්ෂා කරන්නේ, පරිසරයේ සමතුලිතතාවය රැක දෙන්නේත් මෙම නාගරික ප්‍රදේශ ආශ්‍රිතව පිහිටා ඇති පහත් බිම්, වගුරු බිම් හා ජලාශ මගිනි මෙම පහත් බිම් හා වගුරු බිම් සැළසුමකින් තොරව මිනිසුන් හිතුමතේ අනවසර ලෙස ගොඩ කර නිවාස ඉදි කිරීමට පෙළඹෙන්නේ නම් එයින් උද්ගත වන සමාජ ආර්ථික හා පාරිසරික ගැටළු නාගරික මිනිස් ප්‍රජාවට ඉතාමත් අහිතකර ලෙස බලපානු ඇත. නාගරික ජනගහනයට අවශ්‍ය වන නිවාස සපයා දීම අවශ්‍යයෙන් ම කළ යුත්තකි. නමුත් අලංකාර නිවාස ඉදිකර ඒවායේ ජීවත් කරවීම අපේක්ෂා කරන ජනතාවට අවශ්‍ය කරන ආහාර පාන, පිරිසිදු වාතය, ස්වභාව සෞන්දර්යය යනාදිය නොලැබේ නම් එයින් අපේක්ෂා කරන ප්‍රතිඵල නොලැබී යයි. එබැවින් වර්තමානයේ සිදු වන ශීඝ්‍ර නාගරීකරණය දෙස බැලීමේදී ඉඩම් ප්‍රශ්නය ඉතා ප්‍රබල ලෙස බලපා ඇති බව මනාව පැහැදිළි වේ. මෙවන් තත්ත්වයක් යටතේ නගර ඉදි කිරීමේදී නාගරික ජනතාවට නිවාස ඉදි කර ගැනීම සඳහා අඵතින් ඉඩම් සොයා ගැනීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුත්තකි. මෙයට විසඳුමක් වශයෙන් නාගරික ප්‍රදේශ ආසන්නයේ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අත්හැර දමා ඇති පහත් බිම් හා වගුරු බිම් මනාව සිදු කරනු ලබන අධ්‍යයනයකින් පසුව පාරිසරික හා ජීව විද්‍යාත්මක ගැටළු උද්ගත නොවන පරිදි විධිමත් සැළසුමක් යටතේ සංවර්ධනය කර ගැනීමට කටයුතු

කළ යුතු වේ.

නාගරික ප්‍රදේශ වල නිවාස වලින් ඉවතලන කැළි කසල අද නාගරික ජනතාවගේම සෞඛ්‍යයට හා පරිසරයට විශාල තර්ජනයක් වී ඇත. නගරයේ ජලය ගලා බසින ඇල මාර්ග හා කාණු මුළුමනින්ම වාගේ ඉවක් බවක් නැතිව විසිකර ඇති කුණු කසළ හා පොලිතින් බෑග් වලින් පිරී ගොස් ඇත. නගර අලංකාරයට ඇති ජලාශ සතුන්ට පවා ජීවත් වීමට නොහැකි වන පරිදි දූෂණය වී දුගඳ හමන තත්ත්වයට පත් වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස සුළු වර්ෂාවකින් ඇද හැලෙන සීමිත ජල ප්‍රමාණය පවා ගලා යාමට බාධා පැමිණ මහා මාර්ගය අවහිර වී නගරවල ගං වතුර තත්ත්වයක් ඇති කරනු ලබයි. මෙයින් නාගරික ජනතාවට මෙන්ම සාමාන්‍ය ජනතාවටත් විවිධ දුෂ්කරතා වලට මුහුණ පෑමට සිදු වී ඇත. එබැවින් මෙවන් සමාජ විරෝධී හා පරිසර විරෝධී කාර්යයන් වල නියැලෙන පුද්ගලයන්ට විරුද්ධව නිතිමය පියවර ගැනීමත් සමගම නාගරික ජනතාවට ඔවුන් ජීවත් වන පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා එවන් ක්‍රියා වලින් වැළකී කටයුතු කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම පිණිස කඩිනම් නාගරික ප්‍රජා සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ඉතාම ඵලදායි වනු ඇත.

තවද, නාගරික ජනතාවට අවශ්‍ය නිවාස ඉදිකර ගැනීමට ප්‍රධාන බාධාවක්ව පවතින්නේ උග්‍ර ඉඩම් හිඟයයි. එබැවින් පවත්නා සීමිත නාගරික ඉඩම් වලින් හා අලුතින් සංවර්ධනය කරන ලද ඉඩම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා බහු මහල් තට්ටු නිවාස ඉදි කිරීම් කළ යුතුව ඇත.

අද බොහෝ නගරවල අධික තද බදයක් පවතින්නේ නගර මධ්‍යයේ විවිධ රාජ්‍යය ආයතන මධ්‍ය ගත වී තිබෙන නිසාය. රැකී රක්ෂා, අධ්‍යාපන හා වෙනත් නාගරික සේවා පහසුකම් ලබා ගැනීම සඳහා දිනපතා නගර කරා ඇදී එන අති විශාල මහ ජනතාව නිසා සෑම නගරයකම ප්‍රධාන පෙළේ සේවා සපයන ආයතන හා කාර්යයාල නගරයෙන් පිටත උප නගර වල පිහිටුවීම තුළින් නාගරික තදබදය යම්තාක් දුරකට අවම කර ගත හැකි වනු ඇත.

තවද නාගරික වැසියන්ගේ වාසස්ථාන (නිවාස) සේවා සපයන ස්ථාන, අලෙවි මධ්‍යස්ථාන, පාසැල්, ආරෝග්‍ය ශාලා, ආගමික සිද්ධස්ථාන, කාර්යයාල, කර්මාන්ත ශාලා වැනි දෑ ඒවාට ආවේණික කලාපවල පමණක් පිහිටුවීම අත්‍යාවශ්‍ය කටයුත්තකි. නාගරික ජන ජීවිතය පහසු වන පරිදි හා පරිසරය ආරක්ෂා වන පරිදි මේවා ස්ථාන ගත කළ යුතු අතර සෑම විටම කර්මාන්ත ශාලා නාගරික වාසස්ථාන වලින් ඈත්ව හැකිනම් නගරයෙන් බැහැරව ස්ථාන ගත කළ යුතුව ඇත. තවද නාගරික කර්මාන්ත ශාලා වලින් පිටවන වායු ගැස් හා වෙනත් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට භාජනය කළ යුතු අතර, කිසි විටකත් එකී අපද්‍රව්‍ය නිසි කළමනාකරණයකින් තොරව නිදහසේ පරිසරයට මුදා හැරීමට ඉඩ නොතැබිය යුතුය.

මේ අනුව, පාරිසරික සුරක්ෂිතතාවය ඇති වන අයුරින් නගර නිර්මාණය කිරීම යනුවෙන් අදහස් වන්නේ අපගේ ස්වභාවික වටපිටාවට හානියක් සිදු නොවන ආකාරයෙන් හා භෞතික, ආර්ථික, සමාජයීය, පාරිසරික, සංස්කෘතිමය මෙන්ම සදාචාරාත්මක වශයෙන් ද සංවර්ධනයක් ඇති වන පරිදි නගර නිර්මාණය කිරීමයි. එබැවින් ආර්ථික, සමාජීය, පාරිසරික සැලසුම්කරණය, නාගරික සංවර්ධනය, ඉදි කිරීම් හා නාගරික වාස්තු විද්‍යාව යන විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ හසල දැනුමක් ලත් වෘත්තිකයන්ගෙන් සැදුම් ලත් මණ්ඩලයක් මගින් ගනු ලබන ජාතික නාගරික සංවර්ධන ප්‍රතිපත්තියන් තිරසාර

46 පිටුව